අපදානසොභිනී පඤ්ඤා

**ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ**

# උත්තරීතර මහානායක

ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ රාස්සගල පාර්ශ්වයේ මහානායක
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ හිටපු කථිකාචාර්ය
පර්යාප්ති ශාසනධ්වජාග්‍ර ප්‍රවචන කීර්ති ශ්‍රී සද්ධර්මාචාර්ය
ආනන්ද මෛත්‍රෙය වංශාවතංශ

## කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහානායක ස්ථවිර

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව,
ශ්‍රී ලංකා අමරපුර මහා නිකායික සංඝ සභා කාර්යාලය,
අංක 70, ගාලු පාර,
වැල්ලවත්ත,
කොළඹ 06

ශ්‍රී ධර්මානන්ද විද්‍යායතන පිරිවෙන,
මිරිස්වත්ත, බළන්ගොඩ
☎ +94 45 228 7112
+94 71 987 0697
Piriwena1946@gmail.com


2025.11.17

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගරු ජනාධිපති**
**අනුර කුමාර දිසානායක මැතිතුමා**
**ජනාධිපති ලේකම් කාර්යාලය**
**කොළඹ 01**

**ගරු ජනාධිපතිතුමනි,**

**<u>ත්‍රිකුණාමලය කොටුව පාර ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරය සම්බන්ධව ඇති වී ඇති අර්බුදය පිළිබඳවයි.</u>**

යථෝක්ත විහාරස්ථානය වර්ෂ 1951 සිට පවත්වාගෙන එන ලබන විහාරස්ථානයකි. එය බෞ.කො./විහා දේ / 15/15/009 යටතේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මූලවංශික පාර්ශ්වයේ ලියාපදිංචි කරන ලද විහාරස්ථානයකි. 2014 වර්ෂයේ දී මෙම විහාරස්ථානය පිහිටි ඉඩමට එවක ජනාධිපතිතුමන් විසින් දීමනා පත්‍රයක් මගින් හිමිකම් තහවුරු කර ඇත.

02. කරුණු එසේ තිබියදීත්, ඒ හිමිකම් දීමනා ප්‍රදානයන් හා රජයේ ලියාපදිංචිව ඇති මෙම විහාරස්ථානයට හා භික්ෂූන් වහන්සේලාට එල්ලවී ඇති තර්ජන අභියෝග මහා සංඝරත්නයේ සේම බෞද්ධ ජනතාවගේ ද සිත් තැවුලට හේතු වී ඇත. විශේෂයෙන්ම 2025.11.16 දින සිදු වූ සිද්ධීන් පිළිකුලෙන් යුතුව තරයේ හෙලා දකිමි. විහාර භූමියේ බුදු පිළිම ඉවත් කිරීම ට හා භික්ෂූන් වහන්සේලා ට පහරදීමට පොලිසිය කටයුතු කළේ කවරෙකුගේ වුවමනාවන් වෙනුවෙන් දැයි ප්‍රශ්න සහගතය. එම පහර දීම හෙතුවෙන් විහාරාධිපති හිමියන්ට රොහල් ගත වෙන්න සිදු වී ඇත. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන වගන්තිය අමු අමුවේ උල්ලංඝනය කිරීමකි. පොලිසියේ එම අනීතික හැසිරීම තරයේ හෙළා දකිමි.

03 මෙ පිළිබඳ ඔබතුමාගේ කඩිනම් අවධානය යොමු කොට දැනට කඩා ඉවත් කිරීමට යොජනා කර ඇති ගොඩනැගිල්ල ඉවත් නොකරන ලෙසත් විහාර භූමියේ, විහාරස්ථානයේ හා භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව වෙනුවෙන් අදාළ
අංශ දැනුවත් කොට කඩිනම් පියවර ගන්නා ලෙසත් දන්වා සිටිමි.

මෙයට
ශාසනහිතකාමී,

අතිපූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති
උත්තරීතර මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ
ශ්‍රී ලංකා අමරපුර මහා නිකාය

ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ
උත්තරීතර මහානායක කරගොඩ උයන්ගොඩ
මෛත්‍රී මූර්ති මහා ස්ථවිර
ශ්‍රී ධර්මානන්ද පිරිවෙන - බළන්ගොඩ.